**ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය - 2022**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ ("සම්මේලනය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සම්මේලනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සම්මේලනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සම්මේලනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී දරන ලද 2021 වර්ෂයට අදාළව රු.563,212ක වියදම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස දක්වා ඇත. | ගිණුම් සකස් කරන අවස්ථාව වන විට බිල්පත් නොලැබී තිබුණු බැවින් ගිණුම් සකස් කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය |
| (ආ) බීච් වොලිබෝල් ශූරතාවලිය සඳහා නවාතැන් පහසුකම් සැපයීම සඳහා වූ රු. 553,080 ක ලද වට්ටම මූල්‍ය ප්‍රකාශනවල ආදායම ලෙස දක්වා නොතිබුණි. | වට්ටමක් ලෙස ලැබුණු ගෙවිය යුතු මුදල ගිණුම්ගත කර නොතිබුණි. | -එම- |
| (ඇ) මාස 6කට වඩා වැඩි චෙක්පත් සඳහා වන ගැලපීම් රු. 75,000, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි | මෙම කරුණ නිවැරදි කිරීමට කටයුතු කර තිබුණි. | -එම- |
| (ඈ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අතර ගෙවිය යුතු ශේෂ වෙනස රුපියල් 1,021,449 ක් වූ අතර එය සම්මේලනය විසින් සැසඳීමක් සිදු කර නොතිබුණි. | මෙම කරුණ නිවැරදි කිරීමට කටයුතු කර තිබුණි | නොසැසඳූ ශේෂ වෙනස හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සම්මේලනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 839,164 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,862,514 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,023,350 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු ආදායම් රු. 4,917,596 කින් වැඩි වීම මෙම වර්ධනය සඳහා හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| වසර කිහිපයක සිට සම්මේලනය අඛණ්ඩව ශුද්ධ පාඩුවක් ලබමින් තිබුණි. එසේම, සමුච්චිත අරමුදලේ වසර 04 ක් අඛණ්ඩව සෘණ ශේෂයන් පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ සමුච්චිත අරමුදලේ රු.5,057,191 ක සෘණ ශේෂයක් පැවතිණි. එසේම, සම්මේලනයේ ජංගම අනුපාතය 2020, 2021 සහ 2022 වසරවල පිරිහී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම් 1කට ජංගම වගකීම් 78.8 ක් වූ අතර එම තත්වය ද්‍රවශීලතාවයට අහිතකර ලෙස බලපා තිබුණි. ද්‍රවශීලතාවය සහ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ ද්‍රවශීලතාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට විධායක සභාව ක්‍රියා කර ඇත. | සම්මේලනයේ මූල්‍ය කාර්ය සාධනය සහ ද්‍රවශීලතාවය පිළිබඳව කළමනාකරණ මණ්ඩලය විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතාව

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සම්මේලනයේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් පැවැත්වීම පිළිබඳව සාමාජික මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක නොකළද, විධායක කමිටු රැස්වීමේදී සෑම මසකම වියදම් සමාලෝචනය කෙරේ. | සම්මේලනයේ අභ්‍යන්තර පාලනය සඳහා මූල්‍ය විගණනය ක්‍රියාත්මක කළ යුතුය. |

## 4. ගෙවිය යුතු ගිණුම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සම්මේලනය විසින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට සහ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයට වසර 5කට වැඩි කාලයක් ගෙවිය යුතු ව පැවති රු. 3,214,856 ක ශේෂය මේ වන තෙක් පියවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වසරේදී පියවීමට කටයුතු කර ඇත. | ගෙවිය යුතු මුදල් කඩිනමින් පියවිය යුතුය. |

**5. වගවීම සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| එක් එක් වර්ෂය තුළ ගෙවන ලද සාමාජික ගාස්තු, සාමාජිකයින් සම්මේලනයෙන් ඉවත් වූ දිනය සහ සාමාජිකත්වය ලබා ගත් දිනය ඇතුළත් කරමින් සාමාජික ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | 2023 වසර සඳහා ලියාපදිංචි සාමාජිකයින්ගේ ලැයිස්තුව ඉදිරිපත් කර තිබුණි. | සාමාජික ලේඛනය යාවත්කාලීන කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

**5.2 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2016 7(xi) අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගමයේ නියෝගයට අනුව පාලක මණ්ඩලය විසින් සම්මේලනය සඳහා අනුමත සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | ලබන වසර සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීමට අවධානය යොමු කර ඇත. | ජාතික ක්‍රීඩා රෙගුලාසි වල නියමයන්ට අනුව ප්‍රමාදයකින් තොරව සංයුක්ත සැලැස්ම සකස් කළ යුතුය. |

**5.3 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2022 ජූලි 28 සිට අගෝස්තු 08 දක්වා එක්සත් රාජධානියේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට සහභාගී වූ කණ්ඩායමෙන් ආපසු නොපැමිණි ක්‍රීඩකයින් දෙදෙනෙකු සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පැමිණිල්ල විශේෂ විමර්ශන ඒකකයට ඉදිරිපත් කර තිබූ අතර සම්මේලනය විසින් මෙම ක්‍රීඩකයන් සම්බන්ධයෙන් විභාග කිරීමට කටයුතු සංවිධානය කර තිබුණි. | ආපසු නොපැමිණෙන ක්‍රීඩකයින් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි. |